දිනමිණ සිළුමිණ The Silumina epaper

## නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
## සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

# සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ ඉංජිනේරු සහකාර (තාක්ෂණික) තනතුර සඳහා පුරප්පාඩු පිරවීම

## ඉංජිනේරු සහකාර MA 2-2 කළමනාකරණ සහකාර (තාක්ෂණික) - සේවා ගණය තනතුරු 01 කි.

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්** - ඉංජිනේරු සහකාර (සිවිල් / සැලසුම් ශිල්පී / ප්‍රමාණ හා මිණුම් සමීක්ෂණ)

1. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා NVQ පහ (05) වැනි මට්ටමට නොඅඩු ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කර තිබීම .

**අභ්‍යන්තර අයදුම්කරුවන් -** ඉංජිනේරු සහකාර (සිවිල් / සැලසුම් ශිල්පී / ප්‍රමාණ හා මිණුම් සමීක්ෂණ)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**වැටුප** :- MA 2-2 රු.30,310 - 10 X 300 - 7X 350 - 4 X 600 - 20 X 710 = 52,360

**වයස** :- අවු. 18 ට නොඅඩු, අවු. 45 ට නොවැඩි අය විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**සෑම අයදුම්කරුවෙකුම**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**තනතුරට අදාළ පොදු කොන්දේසි**

- මෙම තනතුර ස්ථිර වන අතර, විශ්‍රාම වැටුප් රහිතය. සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 10% ක් සහ සේව්‍යාගෙන් 15% ක්ද සේවක භාරකාර අරමුදලට සේව්‍යාගෙන් 3% ක්ද දායකත්වය දරනු ලබයි.
- රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළයුතු වේ.
- අයදුම්කරු පිළිබඳ වාර්තා ලබාගත හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් අයදුම් පත සමග ඉදිරිපත් කළයුතුය.
- අධ්‍යාපන, වෙනත් සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුවේ.
- අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් බාරගන්නා අවසාන දිනට සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතු වේ

**අයදුම් කළ යුතු ආකාරය**

මේ සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ පෞද්ගලික තොරතුරු යනාදිය ඇතුළත් ජීව දත්ත සටහන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරෙහි **ඉංජිනේරු සහකාර තනතුරට බඳවා ගැනීම** යනුවෙන් සඳහන් කොට පහත සඳහන් ලිපිනයට 2024.02.09 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ hr@cma.lk දරන email (විද්‍යුත් තැපැල) ලිපිනයට එවිය යුතුය. නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්, ප්‍රමාද වී ලැබෙන, අපහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති**

**සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය,**
**1වන මහල, ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,**
**කොළඹ - 2.**